උසස් පෙළ විද්‍යා/ගණිත/කලා/වාණිජ හා තාක්ෂණ විෂය ධාරාවන්ට අදාල සියලුම ප්‍රශ්න පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබා ගැනීමට පිවිසෙන්න www.alevelapi.com වෙත .

4. ආර්ථිකයේ ව්‍යුහමය ලක්ෂණ හඳුනා ගැනීම.
5. ආදායමේ කාර්යාත්මක ව්‍යාප්තිය හඳුනා ගැනීම.
6. සාර්ව ආර්ථිකයේ ශ්‍රිතාත්මක සම්බන්ධතා හඳුනා ගැනීම.
7. ආර්ථික හා සමාජ ප්‍රතිපත්ති සම්පාදනය හා සැලසුම්කරණය.
8. සාර්ව ආර්ථික විචල්‍යයන්ගේ හැසිරීම පුරෝකථනය කිරීම.

ඉහත ප්‍රතිලාභ නිසා සමස්ත ආර්ථිකය පිළිබඳ අවබෝධ කරගැනීමට සහ එහි කාර්යසාධනය විශ්ලේෂණය සඳහා ජාතික ගිණුම් දත්ත ප්‍රබල උපකරණයක් වේ.

**(එක් ප්‍රතිලාභයකට ලකුණු 01 බැගින්; මුළු ලකුණු 04)**

**5.** (i) ආන්තික පරිභෝජන නැඹියාව (MPC) යනුවෙන් කවරක් අදහස් කෙරේ ද? එය එකට වඩා අඩු අගයක් ගනුයේ ඇයි? (ලකුණු 04යි)

(ii) ගුණකයේ අගය ආන්තික පරිභෝජන නැඹියාවේ අගය සමඟ අනුලෝම වශයෙන් සම්බන්ධ වී ඇත්තේ ඇයි? (ලකුණු 04යි)

(iii) කිසියම් කල්පිත ආර්ථිකයක සමාහාර පරිභෝජන වියදම පහත සමීකරණයෙන් පෙන්නුම් කෙරේ.

$$C = 50 + 0.75Y_D$$

තව ද සෑම ආදායම් මට්ටමක දී ම ආයෝජන වියදම රුපියල් බිලියන 700ක් බවත්, ශුද්ධ අපනයන ශූන්‍ය බවත් උපකල්පනය කරන්න. ආණ්ඩුවේ අය-වැය ලේඛනය තුලනය වන අතර ආණ්ඩුවේ මිල දී ගැනීම් සහ බදු රුපියල් බිලියන 500 බැගින් වේ.

(අ) දළ දේශීය නිෂ්පාදිතයේ සමතුලිත මට්ටම ගණනය කරන්න. (ලකුණු 02යි)

(ආ) විභව දළ දේශීය නිෂ්පාදිතය රුපියල් බිලියන 5 000ක් වේ නම්, ආර්ථිකයේ අවධමනාත්මක හෝ උද්ධමනාත්මක හෝ පරතරයක් පවතී ද? එසේ නම් එය කොපමණ ද? (ලකුණු 02යි)

(iv) ගුණක ප්‍රතිවිපාකය යනු කුමක් ද? රජයේ මිල දී ගැනීම් අඩු වීමක ගුණක ප්‍රතිවිපාකය 45° රේඛාව ඇතුළත් රූපසටහනක් යොදාගනිමින් පෙන්නුම් කරන්න. (ලකුණු 04යි)

(v) බදු වෙනස් වූවාට වඩා රජයේ මිල දී ගැනීම් වෙනස් වූ විට මූර්ත දළ දේශීය නිෂ්පාදිතය වැඩි ප්‍රමාණයකින් වෙනස් වන්නේ ඇයි? (ලකුණු 04යි)

**(i)**

ආදායමේ කිසියම් වෙනසක් ($\Delta Y$) නිසා (හෝ වැය කළ හැකි ආදායමේ වෙනසක් -$\Delta Y_d$ ), පරිභෝජන වියදමේ හට ගන්නා වෙනස ($\Delta C$) අනුපාතයක් හෝ ප්‍රතිශතයක් වශයෙන් දැක්වුවහොත් එය ආන්තික පරිභෝජන නැඹියාව ලෙස හැඳින්වේ.

ආන්තික පරිභෝජන නැඹියාව = පරිභෝජන වියදමේ වෙනස / ආදායමේ වෙනස

$= \Delta C / \Delta Y$ හෝ

$= \Delta C / \Delta Yd$

**(නිවැරදි නිර්වචනයට; ලකුණු 02)**

ආදායම වැඩි වන විට පරිභෝජනය වැඩි වුව ද, ආදායම වැඩි වන ප්‍රමාණයෙන්ම පරිභෝජනය වැඩි නොවේ. කේන්ස්ට අනුව, ආන්තික පරිභෝජන නැඹියාව සෑම විටම ධන අගයක් ගන්නා අතර, උපරිම අගය 1 ඉක්මවා නොයයි. MPC අගය 0ත් 1ත් අතර පිහිටයි. ( $0 < MPC > 1$ )

**(නිවැරදි පැහැදිලි කිරීමට, ලකුණු 02)**



උසස් පෙළ විද්‍යා/ගණිත/කලා/වාණිජ හා තාක්ෂණ විෂය ධාරාවන්ට අදාල සියලුම ප්‍රශ්න පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබා ගැනීමට පිවිසෙන්න www.alevelapi.com වෙත .

**(ii)**

ගුණකයෙන් ආරම්භක ස්වායත්ත වියදම්වල වෙනසක් නිසා ජාතික ආදායම් මට්ටම මත හෝ නිමැවුම මත එම වෙනසට වඩා කිහිප ගුණයකින් විශාල බලපෑමක් ඇති වේ.

ගුණකය යනු ආන්තික ඉතුරුම් නැමියාවේ පරස්පරය වේ. ආන්තික ඉතුරුම් නැමියාව 1- MPC ලෙස ලබා ගත හැකිය. ගුණකය ගණනය කරනුයේ,

K = 1 / 1- MPC හෝ K = 1 / MPS

**(MPC සහ MPS සමඟ ගුණකය විස්තර කිරීමට; ලකුණු 02)**

දේශීය නිෂ්පාදනය කළ භාණ්ඩ හා සේවා මත ආන්තික පරිභෝජන නැමියාව ඉහළ යන්නේ නම්, ඒ හරහා ආන්තික ඉතුරුම් නැමියාව පහළ ගොස් ගුණකයේ අගය ඉහළ යයි. ඒ නිසා ගුණකයේ අගය සහ ආන්තික පරිභෝජන නැමියාව අතර අනුලෝම සම්බන්ධයක් ගොඩනැගේ. ආන්තික පරිභෝජන නැමියාව වැඩිවන විට, ආන්තික ඉතුරුම් නැමියාව පහළ යන අතර, ගුණකය විශාල වේ.

**(ධන සම්බන්ධතාවය ගොඩනැගීමට; ලකුණු 02)**

**(iii)**

**(අ)**

Y = E

Y = C + I + G + X – M

$Y = 50 + 0.75Y_D+700+500$

Y = 50 + 0.75(Y – 500) + 700 + 500

**(සමීකරණයට දත්ත ආදේශ කිරීම සඳහා ලකුණු 01)**

Y = 1250 + 0.75Y – 375

Y = 875 + 0.75 Y

Y – 0.75Y = 875

0.25Y = 875

Y = 875 / 0.25

<u>Y = 3500</u> **(ලකුණු 01)**

**(ආ)**

අවධමනාත්මක පරතරයකි. **(ලකුණු 01)**

විභව දළ දේශීය නිෂ්පාදිතය = 5000

සමතුලිත හෝ සත්‍ය දළ දේශීය නිෂ්පාදිතය = <u>3500</u>

අවධමනාත්මක පරතරය = <u>1500</u>

**(අවධමනාත්මක පරතරය ගණනයට; ලකුණු 01)**



උසස් පෙළ විද්‍යා/ගණිත/කලා/වාණිජ හා තාක්ෂණ විෂය ධාරාවන්ට අදාල සියලුම ප්‍රශ්න පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබා ගැනීමට පිවිසෙන්න www.alevelapi.com වෙත .

**(iv)**

ස්වාධීන වියදම් වෙනස් වීම නිසා ආදායම හා නිමැවුම ස්වාධීන වියදම් වෙනස් වූවාට වඩා කිහිප ගුණයකින් වෙනස් වීම ගුණක ප්‍රතිවිපාකය ලෙස සැලකේ. **(ලකුණු 02)**




**(නිවැරදිව $45^0$ රේඛාව ඇතුළත් රූප සටහනට; ලකුණු 02)**

**(v)**

රජයේ මිලදී ගැනීමේ වෙනස් වීමක් නිසා මූර්ත දළ දේශීය නිෂ්පාදිතය මත ඉහළ ගුණක ප්‍රතිවිපාකයක් ඇති වේ. එසේ වන්නේ රජයේ මිල දී ගැනීම් වෙනස් වීම එම ප්‍රමාණයෙන්ම සෘජුවම සමාහාර ඉල්ලුම වෙනස් කරන බැවිනි. **(ලකුණු 02)**

බදු වෙනස් වීමක දි සෘජුවම එම ප්‍රමාණයෙන්ම සමාහාර ඉල්ලුම මතට බලපෑමක් සිදු නොවේ. බදු වෙනස් වීමක් මුලින්ම වැය කළ හැකි ආදායමට බලපාන අතර, ඒ හරහා පරිභෝජන වියදම්වලටත්, සමාහාර ඉල්ලුමටත් බලපෑම් කරයි.

මේ නිසා රජයේ මිල දී ගැනීම් වෙනස් වූ විට බදු වෙනස් වූවාට වඩා වැඩි බලපෑමක් මූර්ත දළ දේශීය නිෂ්පාදිතය මත සිදු වේ. **(ලකුණු 02)**

**විකල්ප පිළිතුර :**

රාජ්‍ය වියදම් ගුණකය = $K_G = 1/ 1 - MPC$

බදු ගුණකය = $K_T = -MPC / 1 - MPC$

**(ගුණකයක් සඳහා ලකුණු 02, ගුණකයන් දෙක හරහා විස්තර කර ඇත්නම්; මුළු ලකුණු 04)**



උසස් පෙළ විද්‍යා/ගණිත/කලා/වාණිජ හා තාක්ෂණ විෂය ධාරාවන්ට අදාල සියලුම ප්‍රශ්න පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබා ගැනීමට පිවිසෙන්න www.alevelapi.com වෙත .

## "ආ" උප කොටස

6. (i) විනිමය සමීකරණය සඳහන් කොට එහි එක් එක් විචල්‍යය හඳුන්වන්න. (ලකුණු 04යි)

(ii) "අධි ඉල්ලුම නිසා උද්ධමනය ආරම්භ වන නමුත් එය අඛණ්ඩව පවත්වාගනුයේ පිරිවැය ඉහළ යාමෙනි." රූපසටහන් යොදා ගනිමින් මෙම ප්‍රකාශය පැහැදිලි කරන්න. (ලකුණු 04යි)

(iii) සඵල හුවමාරු මාධ්‍යයක් ලෙස ක්‍රියා කිරීමට මුදල් විසින් සපුරාලිය යුතු නිර්ණායක කවරේ ද? (ලකුණු 04යි)

(iv) ශ්‍රී ලංකාවේ මූල්‍ය පද්ධතිය සමන්විත වී ඇති ප්‍රධාන ආයතන හතරක් නම් කරන්න. (ලකුණු 04යි)

(v) $M_{2b}$ සහ $M_4$ යන මූල්‍ය සමාහාර සමන්විත වන සංරචක හඳුන්වන්න. (ලකුණු 04යි)

(i).

MV = PT **(විනිමය සමීකරණයට; ලකුණු 02)**

M = මුදල් සැපයුම හෝ මුදල් ප්‍රමාණය

V = මුදලේ සංසරණ ප්‍රවේගය

P = මිල මට්ටම

T = ගණුදෙනු ප්‍රමාණය

**(සියලුම විචල්‍යයන් නිවැරදිව විනිමය සමීකරණය සමඟ දක්වා ඇත්නම් = ලකුණු 02, නැත්නම් ලකුණු 0)**

**විකල්ප පිළිතුරක් :**

MV = PY **(විනිමය සමීකරණයට; ලකුණු 02)**

M = මුදල් සැපයුම හෝ මුදල් ප්‍රමාණය

V = මුදලේ සංසරණ ප්‍රවේගය

P = මිල මට්ටම

Y = අවසන් නිමවුම හෝ මූර්ත දළ දේශීය නිෂ්පාදිතය

**හෝ** PY = නාමික දළ දේශීය නිෂ්පාදිතය

**(සියලුම විචල්‍යයන් නිවැරදිව විනිමය සමීකරණය සමඟ දක්වා ඇත්නම් = ලකුණු 02, නැත්නම් ලකුණු 0)**

**(ii)**

උද්ධමනය යනු පොදු මිල මට්ටමේ සිදුවන අඛන්ඩ ඉහළ යාමයි. සමාහාර ඉල්ලුම් (AD) සහ සමාහාර සැපයුම් (AS) ආදර්ශයට අනුව, සමාහාර ඉල්ලුමේ ඉහළ යාමක් නිසා ආර්ථිකය මත අධි ඉල්ලුමක් නිර්මාණය කරන අතර, ඒ හරහා මිල මට්ටම් ඉහළ යයි. **(ලකුණු 01)**



උසස් පෙළ විද්‍යා/ගණිත/කලා/වාණිජ හා තාක්ෂණ විෂය ධාරාවන්ට අදාල සියලුම ප්‍රශ්න පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබා ගැනීමට පිවිසෙන්න www.alevelapi.com වෙත .




(ලකුණු 01)

සමාහාර ඉල්ලුම $AD_1$ සිට $AD_2$ දක්වා ඉහළ යාම නිසා මිල මට්ටම $P_1$ සිට $P_2$ දක්වා ඉහළ යයි. අධි ඉල්ලුමක් පවත්නා විට, නිෂ්පාදකයින් හට මිල ඉහළ නැංවීම හරහා තම ලාභ තීරු ඉහළ නංවා ගත හැකි වේ.

නිෂ්පාදන පිරිවැය ඉහළ යන විට සමාහාර සැපයුම පහළ ගොස් මිල මට්ටම් ඉහළ යා හැකි අතර, මෙය පිරිවැයෙන් තල්ලු වූ උද්ධමනය ලෙස හඳුනා ගැනේ.




(ලකුණු 01)

$AS_1$, $AS_2$ දක්වා පහළ යාම නිසා, තවදුරටත් මිල ගණන් $P_1$ සිට $P_3$ දක්වා ඉහළ යනුයේ පිරිවැය ඉහළ යාම නිසාය. මේ අනුව අධි ඉල්ලුම අනුව උද්ධමනය ආරම්භ වන නමුත්, එය අඛණ්ඩව පවත්වාගෙන යනුයේ පිරිවැය ඉහළ යාමෙනි. (ලකුණු 01)



උසස් පෙළ විද්‍යා/ගණිත/කලා/වාණිජ හා තාක්ෂණ විෂය ධාරාවන්ට අදාල සියලුම ප්‍රශ්න පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබා ගැනීමට පිවිසෙන්න www.alevelapi.com වෙත .

**(iii)**

1. භුවමාරු මාධ්‍යයක් වශයෙන් පොදු පිළි ගැනීම.
2. කල්පවත්නා සුළු බව.
3. සමජාතීය බව.
4. කුඩා කොටස්වලට බෙදිය හැකි බව.
5. පහසුවෙන් රැගෙන යා හැකි බව.
6. ව්‍යාජ මුදල් හෙවත් අනුකරණ මුදල් නිකුතුව අපහසු වීම.
7. වටිනාකම ස්ථාවරව පැවතීම.

**(එක් කරුණකට ලකුණු 1 බැගින් ; මුළු ලකුණු 04)**

**(iv)**

1. ශ්‍රී ලංකා මහ බැංකුව
2. බලපත්‍රලාභී වාණිජ බැංකු
3. බලපත්‍රලාභී විශේෂිත බැංකු
4. බලපත්‍රලාභී මූල්‍ය සමාගම්
5. සේවක අර්ථසාධක අරමුදල
6. රක්ෂණ සමාගම්
7. විශේෂිත මූල්‍ය සමාගම්

**(ඕනෑම එක් කරුණකට ලකුණු 1 බැගින්; මුළු ලකුණු 04)**

**(v)** $M_{2b} = M_2 + 50\%$ of $TSD_{NRFC} + RD_{FCBU}$

$M_2 = M_1 + TSD_P$

$M_1$ = පටු මුදල් සැපයුම

$TSD_P$ = මහජනතාව සතු වාණිජ බැංකුවල ඇති කාලීන හා ඉතුරුම් තැන්පතු

$TSD_{NRFC}$ = අනේවාසික විදේශ ව්‍යවහාර මුදල් ගිණුම්වල ඇති මහජනයා සතු කාලීන හා ඉතුරුම් තැන්පතු ප්‍රමාණයෙන් 50%

$RD_{FCBU}$ = විදේශ ව්‍යවහාර මුදල් බැංකු ඒකකවල ඇති නේවාසිකයන් සතු තැන්පතු

**(නිවැරදි නම් ලකුණු 02; වැරදි නම් 0)**

**විකල්ප ක්‍රමයක්**

$M_{2b} = M_2$ + **ගැලපුම් කරන ලද විදේශ ව්‍යවහාර මුදල් තැන්පතු**

$M_2$ = පටු මුදල් සැපයුම + මහජනයා සතු වානිජ බැංකු වෙතැති කාලීන සහ ඉතිරිකිරිමේ තැන්පතු

**ගැලපුම් කරන ලද විදේශ ව්‍යවහාර මුදල් තැන්පතු** වලට ඇතුළත් වන්නේ අක්වෙරළ බැංකු ඒකකවල නේවාසික තැන්පතු සහ දේශීය බැංකු ඒකකවල විදේශ ව්‍යවහාර මුදල් තැන්පතුවලින් දේශීය වගකීම් ලෙස හදුනාගත් කොටසක් ඇතුළත් වේ.

**(නිවැරදි නම් ලකුණු 02; වැරදි නම් 0)**



උසස් පෙළ විද්‍යා/ගණිත/කලා/වාණිජ හා තාක්ෂණ විෂය ධාරාවන්ට අදාළ සියලුම ප්‍රශ්න පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබා ගැනීමට පිවිසෙන්න www.alevelapi.com වෙත .

$M_4 = M_1$ + ආසන්න මුදල්

ආසන්න මුදල් = DBU + FCBU + LSB + **RFC**

$M_4 = M_{2b} + RD_{LSB} + RD_{RFC}$

DBU = දේශීය බැංකු ඒකකවල ඇති ආසන්න මුදල්

FCBU = විදේශ ව්‍යවහාර මුදල් බැංකු ඒකකවල ඇති ආසන්න මුදල්

LSB = බලපත්‍රලාභී විශේෂිත බැංකුවල ඇති ආසන්න මුදල්

RFC = ලියාපදිංචි මූල්‍ය සමාගම්වල ඇති තැන්පතු **හෝ**

*LFC = බලපත්‍රලාභී මූල්‍ය සමාගම්වල ඇති තැන්පතු* **(නිවැරදි නම් ලකුණු 02; වැරදි නම් 0)**

**7.** (i) ධන බාහිරතා සහ සෘණ බාහිරතා පවතින විට, සමතුලිත නිමැවුම් මට්ටම සහ සමාජයීය වශයෙන් ප්‍රශස්ත නිමැවුම් මට්ටම අතර කෙබඳු වෙනස්කම් දක්නට ලැබේ ද? රූපසටහන් යොදා ගනිමින් ඔබේ පිළිතුර පැහැදිලි කරන්න. (ලකුණු 04යි)

(ii) අර්ධ පොදු භාණ්ඩ සහ ගුහසාධන භාණ්ඩවල කැපීපෙනෙන ලක්ෂණ උදාහරණ සහිතව පැහැදිලි කරන්න. (ලකුණු 04යි)

(iii) ශ්‍රී ලංකා රජයේ පුනරාවර්තන වියදමෙහි ප්‍රධාන සංරචක නම් කරන්න. (ලකුණු 04යි)

(iv) 'අධි බදු බර' යන්නෙන් කවරක් අදහස් වේ ද? ඉල්ලුමේ මිල අනම්‍යතාවක් පවතින භාණ්ඩයක් මත පනවනු ලබන නිෂ්පාදන බද්දක අධි බදු බර රූපසටහනක් යොදා ගනිමින් පැහැදිලි කරන්න. (ලකුණු 04යි)

(v) පසුගිය වසර තුන තුළ ශ්‍රී ලංකාව අය-වැය හිඟය මූල්‍යනය කිරීම සඳහා පුළුල් වශයෙන් යොදාගනු ලැබූ මූලාශ්‍ර සහ උපකරණ නම් කරන්න. (ලකුණු 04යි)

(i).

බාහිරතා (ධන හෝ සෘණ) පවත්නා විට සමාජයීය ආන්තික පිරිවැය (SMC) සහ පෞද්ගලික ආන්තික පිරිවැය (PMC) අතර මෙන්ම සමාජයීය ආන්තික ප්‍රතිලාභ (SMB) සහ පෞද්ගලික ආන්තික ප්‍රතිලාභ (PMB) අතර ද වෙනස්කම් ඇති වේ. මේ හරහා වෙළෙඳපොළේ එක්කෝ අවශ්‍ය ප්‍රමාණයට වඩා වැඩි නැතහොත් අවශ්‍ය ප්‍රමාණයට වඩා අඩු නිෂ්පාදනයක් හෝ පරිභෝජනයක් සිදු වේ. සමාජයීය වශයෙන් ප්‍රශස්ත ලෙස සම්පත් බෙදා වෙන්කරනු ලබනුයේ සමාජයීය ආන්තික පිරිවැය, සමාජයීය ආන්තික ප්‍රතිලාභවලට සමාන වන විටය. **(ලකුණු 01)**

**නිෂ්පාදනයේ සෘණ බාහිරතාවක්** පවත්නා විට, ආන්තික සමාජයීය පිරිවැය, ආන්තික පෞද්ගලික පිරිවැය අභිභවා යයි. එවිට නිදහස් වෙළෙඳපොළ ආර්ථිකයක් මඟින් ලබා දෙනු ලබන සමතුලිත නිමැවුම සමාජයීය වශයෙන් ප්‍රශස්ත නිමැවුමට වඩා වැඩි වේ. **(ලකුණු 01)**

පහත සඳහන් රූප සටහන මගින් නිෂ්පාදනයේ සෘණ බාහිරතාවක් ඉදිරිපත් කරයි.



උසස් පෙළ විද්‍යා/ගණිත/කලා/වාණිජ හා තාක්ෂණ විෂය ධාරාවන්ට අදාල සියලුම ප්‍රශ්න පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබා ගැනීමට පිවිසෙන්න www.alevelapi.com වෙත .




ඉහත ප්‍රස්තාරයට අනුව, වෙළෙඳපොළ මඟින් සපයනු ලබන Qp නිමැවුම් මට්ටම, සමාජයීය වශයෙන් ප්‍රශස්ත නිමැවුම් මට්ටම වන Qs ට වඩා වැඩි වේ. එබැවින් නිෂ්පාදනයේ ඍණ බාහිරතාවක් පවත්නා විට සමාජයට අවශ්‍ය කරන ප්‍රමාණයට වඩා වැඩි නිෂ්පාදනයක් (අධි නිෂ්පාදනයක්) සිදු වේ.

**නිෂ්පාදනයේ ධන බාහිරතාවක් පවතින විට,** ආන්තික පෞද්ගලික පිරිවැය ආන්තික සමාජයීය පිරිවැය අභිභවා යයි. එවිට සමාජයීය වශයෙන් ප්‍රශස්ත නිමැවුම් මට්ටම වෙළෙඳපොළ මඟින් ලබා දෙන්නා වූ නිෂ්පාදන මට්ටමට වඩා වැඩි වේ. පහත රූප සටහන මඟින් නිෂ්පාදනයේ ධන බාහිරතාවක් පෙන්නුම් කරයි.




www.alevelapi.com



උසස් පෙළ විද්‍යා/ගණිත/කලා/වාණිජ හා තාක්ෂණ විෂය ධාරාවන්ට අදාළ සියලුම ප්‍රශ්න පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබා ගැනීමට පිවිසෙන්න www.alevelapi.com වෙත .

ඉහත රූප සටහනට අනුව නිෂ්පාදනයේ ධන බාහිරතාවක් පවත්නා විට සමාජයීය වශයෙන් ප්‍රශස්ත නිමැවුම් මට්ටම වන Qs, වෙළෙඳපොළ සමතුලිත නිමැවුම් මට්ටම වන Qp ට වඩා වැඩිවන අතර, අදාළ භාණ්ඩය හෝ සේවාව සමාජයට අවශ්‍ය ප්‍රමාණයට වඩා අඩුවෙන් (ඌණ නිෂ්පාදනයක්) සැපයේ.

**පරිභෝජනයේ සෘණ බාහිරතාවක්** පවත්නා විට, ආන්තික පෞද්ගලික ප්‍රතිලාභ, ආන්තික සමාජයීය ප්‍රතිලාභ අභිභවා යයි. එවිට නිදහස් වෙළෙඳපොළ ආර්ථිකයක් මගින් ලබා දෙනු ලබන සමතුලිත පාරිභෝජන මට්ටම සමාජයීය වශයෙන් ප්‍රශස්ත පරිභෝජන මට්ටමට වඩා වැඩි වේ. **(ලකුණු 01)**

පහත සඳහන් රූප සටහන මගින් පරිභෝජනයේ සෘණ බාහිරතාවක් ඉදිරිපත් කරයි. එම ප්‍රස්තාරයට අනුව, වෙළෙඳපොළ මගින් සපයනු ලබන Qp පරිභෝජන මට්ටම, සමාජයීය වශයෙන් ප්‍රශස්ත පරිභෝජන මට්ටම වන Qs ට වඩා වැඩි වේ. එබැවින් පරිභෝජනයේ සෘණ බාහිරතාවක් පවත්නා විට සමාජයට අවශ්‍ය කරන ප්‍රමාණයට වඩා වැඩි පරිභෝජනයක් (අධි පරිභෝජනයක්) සිදු වේ.




**පරිභෝජනයේ ධන බාහිරතාවක්** පවත්නා විට, ආන්තික සමාජයීය ප්‍රතිලාභ, ආන්තික පෞද්ගලික ප්‍රතිලාභ අභිභවා යයි. එවිට නිදහස් වෙළෙඳපොළ ආර්ථිකයක් මගින් ලබා දෙනු ලබන සමතුලිත පාරිභෝජන මට්ටම සමාජයීය වශයෙන් ප්‍රශස්ත පරිභෝජන මට්ටමට වඩා අඩු වේ. **(ලකුණු 01)**

පහත සඳහන් රූප සටහන මගින් **පරිභෝජනයේ ධන බාහිරතාවක්** ඉදිරිපත් කරයි.



උසස් පෙළ විද්‍යා/ගණිත/කලා/වාණිජ හා තාක්ෂණ විෂය ධාරාවන්ට අදාල සියලුම ප්‍රශ්න පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබා ගැනීමට පිවිසෙන්න www.alevelapi.com වෙත .




ඉහත ප්‍රස්තාරයට අනුව, සමාජයීය වශයෙන් ප්‍රශස්ත පරිභෝජන මට්ටම වන Qs වෙළෙඳපොළ මඟින් සපයනු ලබන Qp පරිභෝජන මට්ටම අභිබවා යයි. එබැවින් පරිභෝජනයේ ධන බාහිරතාවක් පවත්නා විට සමාජයට අවශ්‍ය කරන ප්‍රමාණයට වඩා අඩු පරිභෝජනයක් (ඌණ පරිභෝජනයක්) දක්නට ලැබේ.

**ධන හෝ ඍණ බාහිරතාවක් පැහැදිලි කිරීමට එක් ලකුණ බැගින් උපරිම ලකුණු දෙකකි. ඕනෑම ප්‍රස්ථාර දෙකක් මඟින් ධන සහ ඍණ බාහිරතාවක් පැහැදිලි කරයි නම් ලකුණු 02, මුළු ලකුණු 04**

**(ii)**

www.alevelapi.com

අර්ධ වශයෙන් පරිභෝජනයෙන් වැළැක්විය නොහැකි සහ අර්ධ වශයෙන් තරඟකාරීත්වයක් නොමැති භාණ්ඩ අර්ධ පොදු භාණ්ඩ ලෙස හැඳින් වේ. අර්ධ පොදු භාණ්ඩ කිසියම් ධාරිතා මට්ටමක් කරා ළඟාවන තුරු පරිභෝජනයේ තරඟකාරිත්වයක් නොමැති සහ පරිභෝජනය සීමා කිරීමේ හැකියාවක් තිබෙන භාණ්ඩයන් වේ.

උදාහරණ වශයෙන් මහා මාර්ග, උද්‍යාන, මුහුදු වෙරළ, චිත්‍රපට ශාලා, කලාගාර, කෞතුකාගාර වැනි දෑ කිසියම් සීමාවක් දක්වා සාමූහිකව පරිභෝජනය කළ හැකිය. එම සීමාව තුළ එක් අයෙකු විසින් කරනු ලබන පරිභෝජනය නිසා තවත් අයෙකුට එම භාණ්ඩය හෝ සේවාව පරිභෝජනය කිරීමට ඇති අවස්ථාව අහිමි වී නොයයි. එමෙන්ම මෙබඳු ආයතන වෙත ප්‍රවේශ වීම වළක්වාලීමේ හැකියාවක් ද පවතී. එනම් පෞද්ගලික භාණ්ඩයක දී මෙන් ම මෙවැනි භාණ්ඩ සම්බන්ධයෙන් ද පරිභෝජනය වළක්වාලීමේ හැකියාව සැපයුම්කරුවාට ඇත.



උසස් පෙළ විද්‍යා/ගණිත/කලා/වාණිජ හා තාක්ෂණ විෂය ධාරාවන්ට අදාල සියලුම ප්‍රශ්න පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබා ගැනීමට පිවිසෙන්න www.alevelapi.com වෙත .

අර්ධ පොදු භාණ්ඩ හැඳින්වීමට ඇතැම් විටක "ක්ලබ් භාණ්ඩ" යන යෙදුම ද භාවිත කෙරේ. ඇතැම් ක්‍රීඩා සමාජ සම්බන්ධයෙන් අර්ධ පොදු භාණ්ඩ ලක්ෂණ හඳුනා ගත හැකිය. උදාහරණයක් වශයෙන් ගොල්ෆ් හෝ පිහිණුම් හෝ වැනි ක්‍රීඩා සමාජයක් ගත් විට ඒවායේ උපරිම ධාරිතාවය කරා ළඟා වන තුරු, පරිභෝජනයේ තරඟකාරීත්වයක් නොමැත. පිහිණුම් සමාජයක සාමාජිකත්වය ලබා ගැනීම සීමා කිරීමේ හැකියාව පවතී. එහෙත් එක් ක්‍රීඩකයෙකු පිහිණුම් තටාකයේ පිහිණීම නිසා තවත් ක්‍රීඩකයෙකුට පිහිණීමට ඇති අවස්ථාව අහිමි නොවේ. පිහිණුම් තටාකයේ ධාරිතාව කරා ළඟා වන තුරු, එය සාමූහික ව පරිභෝජනය කිරීමේ හැකියාව පවතී. ගොල්ෆ් ක්‍රීඩා සමාජයක ද මෙම ලක්ෂණ දැකිය හැකිය. එක් ක්‍රීඩකයෙකු ක්‍රීඩා කිරීම නිසා, තවත් ක්‍රීඩකයෙකුට ගොල්ෆ් ක්‍රීඩාවේ යෙදීමට ඇති අවස්ථාව සීමා නොවේ.

**(අර්ධ පොදු භාණ්ඩවල ලක්ෂණ උදාහරණ සහිතව පැහැදිලි කරන්නේ නම් ලකුණු 02, අර්ධ පොදු භාණ්ඩ නිර්වචනය කර උදාහරණ පමණක් දී ඇති නම් ලකුණු 01)**

පරිභෝජනයේ දී පෞද්ගලික ප්‍රතිලාභ ඉක්මවා විශාල වශයෙන් සමාජ ප්‍රතිලාභ ලැබෙන භාණ්ඩ ශුභ සාධන භාණ්ඩ වේ. එමෙන්ම ශුභ සාධන භාණ්ඩ පරිභෝජනය කිරීමෙන් විශාල වශයෙන් බාහිර ප්‍රතිලාභ හට ගනියි.

උදාහරණ වශයෙන් අධ්‍යාපනය, සෞඛ්‍ය, ලෙඩ රෝග වළක්වාලීමට ගන්නා එන්නත් ආදිය ශුභ සාධන භාණ්ඩ ලෙසට සැලකේ. අධ්‍යාපනය සම්බන්ධයෙන් සලකා බැලීමේ දී ඉගෙනීමට අවශ්‍ය කැප කිරීම් පිළිබඳව සිසුන් දන සිටිය ද, අනාගත රැකියාව, වැටුප, කුසලතා, සමාජ තත්ත්වය සහ හොඳ පුරවැසියෙකු වීම යන කාරණා සම්බන්ධයෙන් ඔවුනට ලැබෙන ප්‍රතිලාභ ඔවුන් අධ්‍යාපනයට ඉල්ලුම් කිරීමේ දි නොසලකා හරියි. මේ අනුව, අධ්‍යාපනය පරිභෝජනයේ ධන බාහිරතාවයක් ඇති කරන අතර, නිදහස් වෙළෙඳපොළ එය ග්‍රහණය කර ගැනීමට අසමත් වේ. වෙළෙඳපොළ මඟින් ලබාදෙන අධ්‍යාපනය සමාජයීය වශයෙන් ප්‍රශස්ත මට්ටමට වඩා අඩුය.

අධ්‍යාපනයේ තවත් වාසියක් නම්, එමඟින් සමාජයට බාහිර ප්‍රතිලාභ ජනනය කරන අතර, අධ්‍යාපනය ඉල්ලුම් කරනු ලබන අවස්ථාවේ දී ඒ පිළිබඳව පුද්ගලයෙකු සැලකිල්ලක් නොදැක්විමයි. උදාහරණයක් ලෙසට එක් ශිෂ්‍යයෙකු ඉගෙන ගැනීමට වෙහෙසෙනුයේ අනෙක් අයට ලැබෙන ප්‍රතිලාභ නිසා නොවේ. මෙහිදී අනෙකුත් බාහිර පාර්ශව ලෙස හඳුනා ගනු ලබන්නේ අනාගත සේවා යෝජකයින්, පවුල, හිත-මිතුරන් සහ සමාජයයි.

සෞඛ්‍ය සේවය ද ශුභ සාධන භාණ්ඩයකි. උදාහරණයක් ලෙසට ලෙඩ රෝග වළක්වාලීමට ගනු ලබන එන්නතක් නිසා පෞද්ගලික ප්‍රතිලාභ හට ගන්නේ කුමන විට ද යන්න දැන ගැනීමට අසීරුය. එමෙන්ම එවැනි එන්නතක් ලබා ගැනීම නිසා සමාජයේ අනෙකුත් පුද්ගලයින්ට බෝවන රෝග ව්‍යාප්ත වීම වැළකී යයි. එහෙත් අනෙක් අයට ලෙඩ රෝග බෝ වීම වළක්වාලීම වෙනුවෙන් එන්නතක් ලබා ගන්නන් පිරිස ඉතා සීමිත ය.

**(ශුභ සාධන භාණ්ඩවල ලක්ෂණ උදාහරණ සහිතව පැහැදිලි කරන්නේ නම් ලකුණු 02, ශුභ සාධන භාණ්ඩ නිර්වචනය කර උදාහරණ පමණක් දී ඇති නම් ලකුණු 01)**



උසස් පෙළ විද්‍යා/ගණිත/කලා/වාණිජ හා තාක්ෂණ විෂය ධාරාවන්ට අදාල සියලුම ප්‍රශ්න පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබා ගැනීමට පිවිසෙන්න www.alevelapi.com වෙත .

**(iii)**

පුනරාවර්තන වියදමේ ප්‍රධාන සංරචක,

1). භාණ්ඩ හා සේවා වියදම්

2). පොළී ගෙවීම්

3). වර්තන සංක්‍රාම සහ සහනාධාර

**(සංරචක 03ම නිවැරදි නම් ලකුණු 04යි. 2ක් නිවැරදි නම් ලකුණු 02යි)**

**(iv)**

බද්දක් නිසා ඇතිවන සම්පත් බෙදී යාමේ අකාර්යක්ෂමතාවයෙන් සමාජයට අහිමි වන ශුභ සාධනය අධි බදු බර ලෙස හැඳින්වේ. එම ප්‍රදේශය පෙන්නුම් කරන ත්‍රිකෝණය හාර්බර්ගර් ත්‍රිකෝණය ලෙස ද හැඳින් වේ. **( සංකල්පයට ලකුණු 01)**




**(ප්‍රස්ථාරය සඳහා ලකුණු 02)**

මිල අනම්‍යතාවයක් පවතින විට පාරිභෝගිකයා වැඩි අධි බදු බරක් දරයි. ($P_b - P^* > P^* - P_s$)

**(ලකුණු 01)**

**(v) පුළුල් වශයෙන් යොදා ගත් මූලාශ්‍ර :**

1. විදේශීය මූලාශ්‍ර
   - ජාත්‍යන්තර ස්වෛරීත්ව බැඳුම්කර නිකුතුන්
   - ව්‍යාපෘති ණය
2. දේශීය මූලාශ්‍ර
   - බැංකු - වෙළෙඳපොළ ණය ගැනුම්
     - මහ බැංකුව
     - බලපත්‍ර ලාභී වාණිජ බැංකු



උසස් පෙළ විද්‍යා/ගණිත/කලා/වාණිජ හා තාක්ෂණ විෂය ධාරාවන්ට අදාල සියලුම ප්‍රශ්න පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබා ගැනීමට පිවිසෙන්න www.alevelapi.com වෙත .

3. බැංකු නොවන - වෙළෙඳපොළ නොවන ණය ගැනුම්
   සේවක අර්ථ සාධක අරමුදල - EPF
   ජාතික ඉතිරිකිරීමේ බැංකුව - NSB

**(එක් මූලාශ්‍රයකට ලකුණු 01 බැගින්; මුළු ලකුණු 02)**

**පුළුල් වශයෙන් යොදා ගත් උපකරණ :**

1. භාණ්ඩාගාර බැඳුම්කර
2. භාණ්ඩාගාර බිල්පත්
3. ශ්‍රී ලංකා සංවර්ධන බැඳුම්කර
4. මහ බැංකු අත්තිකාරම්
5. රුපියල් ණය

**(එක් උපකරණයකට ලකුණු 01 බැගින්; මුළු ලකුණු 02)**

**8.** (i) A නම් රටට තමන්ගේ සියලුම සම්පත් භාවිතයට ගත් විට X භාණ්ඩයෙන් ඒකක 80ක් හෝ Y භාණ්ඩයෙන් ඒකක 60ක් හෝ නිපදවිය හැකි ය. B නම් රටට ඒ අන්දමින් X භාණ්ඩයෙන් ඒකක 60ක් හෝ Y භාණ්ඩයෙන් ඒකක 60ක් හෝ නිපදවිය හැකි යැයි සිතන්න.

(අ) ස්ථාවර පිරිවැය තත්ත්වයක් පවතී යැයි උපකල්පනය කොට සාපේක්ෂ පිරිවැය වාසි මත එක් එක් රට විශේෂීකරණය කළ යුත්තේ කවර භාණ්ඩයක් දැයි දක්වන්න. (ලකුණු 02යි)

(ආ) අන්‍යෝන්‍ය වශයෙන් වාසිදායක වෙළෙඳාමක් හට ගැනීම සඳහා X භාණ්ඩය සහ Y භාණ්ඩය අතර හුවමාරු අනුපාතය කවර සීමාවන් තුළ තිබිය යුතු ද? (ලකුණු 02යි)

(ii) ශ්‍රී ලංකාව විසින් අත්සන් කොට ඇති (ratified) නිදහස් වෙළෙඳ ගිවිසුම් හතරක් නම් කරන්න. (ලකුණු 04යි)

(iii) පසුගිය වසර පහ තුළ ශ්‍රී ලංකාවේ වෙළෙඳ හිඟය විශාල වශයෙන් පුළුල් වීමට බලපා ඇති හේතු කවරේ ද? (ලකුණු 04යි)

(iv) කල්පිත ආර්ථිකයක ගෙවුම් ශේෂ ලේඛනයක සංරචක පහත සඳහන් වගුව පෙන්නුම් කරයි.

| ගෙවුම් ශේෂයේ සංරචක | රුපියල් බිලියන |
|---|---|
| වෙළෙඳ ශේෂය | – 960 |
| සේවා (ශුද්ධ) | 340 |
| ප්‍රාථමික ආදායම (ශුද්ධ) | – 230 |
| ද්විතීය ආදායම (ශුද්ධ) | 630 |
| ප්‍රාග්ධන ගිණුම (ශුද්ධ) | 20 |

(අ) ජංගම ගිණුමේ ශේෂය කොපමණ ද? (ලකුණු 02යි)

(ආ) මූල්‍ය ගිණුමේ ශේෂය කොපමණ ද? (ලකුණු 02යි)

(v) පාලිත නම්‍ය විනිමය අනුපාතික ක්‍රමය කරා රටවල් යොමු කර වීමට බලපෑ නිදහසේ උච්චාවචනය වන විනිමය අනුපාතිකයන්ගේ අවාසි කවරේ ද? (ලකුණු 04යි)

**(i) (අ)**

A රටට X භාණ්ඩය නිෂ්පාදනය කිරීමේ සාපේක්ෂ වාසියක් පවතී. මක්නිසාදයත්, A රටෙහි X භාණ්ඩය නිෂ්පාදනය කිරීමේ ආවස්ථික පිරිවැය B රටට වඩා අඩු ය.

A රටෙහි X භාණ්ඩය නිෂ්පාදනය කිරීමේ ආවස්ථික පිරිවැය = 60/80 = 0.75

B රටෙහි X භාණ්ඩය නිෂ්පාදනය කිරීමේ ආවස්ථික පිරිවැය = 60/60 = 1

A රට X භාණ්ඩය සඳහා සාපේක්ෂ වාසි ඇති නිසා A රට විශේෂීකරණය කළ යුත්තේ X භාණ්ඩය යි.

**(ලකුණු 01)**



උසස් පෙළ විද්‍යා/ගණිත/කලා/වාණිජ හා තාක්ෂණ විෂය ධාරාවන්ට අදාල සියලුම ප්‍රශ්න පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබා ගැනීමට පිවිසෙන්න www.alevelapi.com වෙත .

B රටට Y භාණ්ඩය නිෂ්පාදනය කිරීමේ සාපේක්ෂ වාසියක් පවතී. මක්නිසාදයත්, B රටෙහි Y භාණ්ඩය නිෂ්පාදනය කිරීමේ ආවස්ථික පිරිවැය A රටට වඩා අඩු ය.

A රටෙහි Y භාණ්ඩය නිෂ්පාදනය කිරීමේ ආවස්ථික පිරිවැය = 80/60 = 1.3

B රටෙහි Y භාණ්ඩය නිෂ්පාදනය කිරීමේ ආවස්ථික පිරිවැය = 60/60 = 1

B රට Y භාණ්ඩය සඳහා සාපේක්ෂ වාසි ඇති නිසා B රට විශේෂීකරණය කළ යුත්තේ Y භාණ්ඩය යි.

**(ලකුණු 01)**

**(ආවස්ථික පිරිවැය අනුපාත ගණනය කිරීම ලකුණු ප්‍රදානය කිරීම සඳහා අවශ්‍ය වේ)**

**(ආ)** අන්‍යොන්‍ය වශයෙන් වාසිදායක වෙළෙඳාමක් හට ගැනීමට නම්, වෙළෙඳ අනුපාතයන්,

- X භාණ්ඩ 1ක් සඳහා Y භාණ්ඩ 0.75ට වැඩි 1ට අඩු අගයක් අතර හුවමාරු විය යුතු ය. **(ලකුණු 01)**
- Y භාණ්ඩ 1ක් සඳහා X භාණ්ඩ 1.3ට අඩු 1ට වැඩි අගයක් අතර හුවමාරු විය යුතු ය. **(ලකුණු 01)**

**(ii)**

1. ආසියා ශාන්තිකර නිදහස් වෙළෙඳ ගිවිසුම - (1975)
2. ඉන්දු ශ්‍රී ලංකා නිදහස් වෙළෙඳ ගිවිසුම - (1998)
3. පකිස්ථාන් ශ්‍රී ලංකා නිදහස් වෙළෙඳ ගිවිසුම - (2005)
4. දකුණු ආසියානු නිදහස් වෙළෙඳ ගිවිසුම - (2006)
5. ශ්‍රී ලංකා සිංගප්පූරු නිදහස් වෙළෙඳ ගිවිසුම - (2018)

**(ඉහතින් දක්වා ඇති ඕනෑම හතරකට; මුළු ලකුණු 04)**

**(iii)**

1. අපනයන ඉපැයුම්වලට වඩා ආනයන වියදම් ඉහළ යාම. (අපනයන වේගයෙන් ඉහළ යාම, මේ සඳහා වාහන ආනයන ඉහළ යාම හේතු විය. කාර්මික අපනයනවල සුළු වර්ධනයක් දැකිය හැකි වුව ද කෘෂිකාර්මික සහ ඛනිජ අපනයන පහළ යාම)
2. ඛනිජ තෙල් ආනයන වියදම් ඉහළ යාම.
3. ඇමෙරිකානු ඩොලරයට සාපේක්ෂව ශ්‍රී ලංකා රුපියල සැලකිය යුතු ලෙස ක්ෂය වීම.
4. ප්‍රධාන අපනයන වෙළෙඳපොළවල පහළ වර්ධනයක් සහ ආර්ථික අස්ථාවරත්වයක් ඇති වීම.
5. අපනයන විවිධාංගීකරණය දුර්වල වීම.

**(ඕනෑම එකකට ලකුණු 01 බැගින් ; මුළු ලකුණු 04)**



උසස් පෙළ විද්‍යා/ගණිත/කලා/වාණිජ හා තාක්ෂණ විෂය ධාරාවන්ට අදාළ සියලුම ප්‍රශ්න පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබා ගැනීමට පිවිසෙන්න www.alevelapi.com වෙත .

**(iv)**

**(අ)**

ජංගම ගිණුමේ ශේෂය = වෙළෙඳ ගිණුමේ ශේෂය + සේවා ගිණුමේ ශේෂය + ප්‍රාථමික ආදායම් ගිණුමේ ශේෂය + ද්විතියික ආදායම් ගිණුමේ ශේෂය

= (-960) + 340 + (-230) + 630

= (-1190) + 970

= -220 **(ලකුණු 02)**

**(ආ)** ජංගම හා ප්‍රාග්ධන ගිණුමේ ශේෂය = ජංගම ගිණුමේ ශේෂය + ප්‍රාග්ධන ගිණුමේ ශේෂය

= -220 + 20

= -200

එම නිසා මූල්‍ය ගිණුමේ ශේෂය = 200 **(ලකුණු 02)**

**(v)** පාලිත නම්‍ය විනිමය අනුපාත ක්‍රමය සමග සැසදිමේ දි නම්‍ය විනිමය අනුපාත ක්‍රමයේ අවාසිඃ

1. පාලිත නම්‍ය විනිමය අනුපාත ක්‍රමයක් හා සැසඳීමේ දී නම්‍ය විනිමය අනුපාත ක්‍රමයක් යටතේ ව්‍යාපාරික අස්ථාවරත්වය ඉහළ දමන අතර ජාත්‍යන්තර වෙළෙඳාම සහ ආයෝජන අඩු වීමක් සිදු වේ.
2. පාලිත නම්‍ය විනිමය අනුපාතික ක්‍රමයකට වඩා නම්‍ය විනිමය අනුපාතික ක්‍රමයක් යටතේ විශාල පරිමාණයේ සමපේක්ෂණයන් සිදු විය හැකි වීම.
3. නම්‍ය විනිමය අනුපාතිකයක දී පාලිත නම්‍ය විනිමය අනුපාතිකයකට වඩා මූල්‍ය සහ ෆිස්කල් ප්‍රතිපත්තිය නිදහසේ භාවිත කිරීමේ හැකියාව ලැබුණ ද, වගකීම් විරහිත ආණ්ඩු මෙම ප්‍රතිපත්ති නිදහස කෙලෙසමින් උද්ධමනාත්මක ෆිස්කල් සහ මූල්‍ය ප්‍රතිපත්තිවලට යොමු විය හැකි වීම.

**(ඕනෑම අවාසි දෙකක් සඳහා; ලකුණු 04)**

**9.** (i) 'ඵලදායීතාව' යන සංකල්පයෙන් කවරක් අදහස් වේ ද? ඵලදායීතාව තීරණය කෙරෙන ප්‍රධාන සාධක කවරේ ද? (ලකුණු 05යි)

(ii) "ජීවිතයේ ගුණාත්මක තත්ත්වය මිනුම් කිරීම සඳහා ප්‍රතිශීර්ෂ දළ ජාතික ආදායමේ (GNI) වෘද්ධිය ප්‍රමාණවත් මිනුමක් නොවේ." පැහැදිලි කරන්න. (ලකුණු 05යි)

(iii) මානව සංවර්ධන දර්ශකය යනු කුමක් ද? සංවර්ධනය පිළිබඳ අවශේෂ මිනුම් සමග බලන විට මානව සංවර්ධන දර්ශකයේ වාසි හා අවාසි කවරේ ද? (ලකුණු 05යි)

(iv) ශ්‍රී ලංකාවේ අන්ත දරිද්‍රතාව කෙරෙහි බලපානු ලබන හේතු කවරේ ද? (ලකුණු 05යි)



උසස් පෙළ විද්‍යා/ගණිත/කලා/වාණිජ හා තාක්ෂණ විෂය ධාරාවන්ට අදාල සියලුම ප්‍රශ්න පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබා ගැනීමට පිවිසෙන්න www.alevelapi.com වෙත .

**(i)**

කිසියම් යෙදවුම් ඒකක ප්‍රමාණයකින් ලබා ගත හැකි නිමැවුම් ඒකක ප්‍රමාණය ඵලදායීතාවය වේ. **(ලකුණු 01)**

**ඵලදායීතාවය තීරණය කරන සාධක පහතින් දැක් වේ.**

1. ශ්‍රමයේ ගුණාත්මක තත්ත්වය (අධ්‍යාපනය, වෘත්තීය පුහුණුව, අත්දැකීම්)
2. තාක්ෂණය
3. නව්‍යතා (පර්යේෂණ හා සංවර්ධනය සඳහා දරන වියදම්)
4. ප්‍රාග්ධන ආයෝජන
5. මූල්‍ය වෙළෙඳපොල සංවර්ධනය
6. ස්වභාවික සම්පත්
7. යටිතල පහසුකම්
8. නියාමනයන්
9. ආකල්ප සහ ප්‍රතිමාන **(එක් සාධකයකට ලකුණු 1 බැගින්; මුළු ලකුණු 04)**

**(ii)**

ඒක පුද්ගල දළ ජාතික ආදායමේ වර්ධනයක් ලෙසට අදහස් කරනුයේ පෙර වර්ෂයට සාපේක්ෂව බලන කළ පුද්ගලයෙකුට දළ ජාතික ආදායමෙන් හිමිවන සාමාන්‍ය ආදායමේ ඉහළ යාමයි. ඒක පුද්ගල දළ ජාතික නිෂ්පාදිතය සාමාන්‍ය ජාතික ආදායම පමණක් පෙන්නුම් කරන අතර, එය ජීවන තත්ත්වය මිනුම් කිරීමට ප්‍රමාණවත් මිනුමක් නොවේ. **(ලකුණු 02)**

ජීවන තත්ත්වය යන්න විෂයානුබද්ධ සංකල්පයක් වන අතර, එමගින් පුද්ගල සතුට, සාධාරණත්වය, සමානාත්මතාවය සහ පුද්ගල ගරුත්වය, මානව අයිතීන්, වෙනස්කොට සැලකීමෙන් නිදහස් වීම, ස්ත්‍රී-පුරුෂභාවය, ජාතිය, භාෂාව, ආගම, දේශපාලන විශ්වාසයන්, ජාතිකත්වය සහ සමාජ-ආර්ථික තත්ත්වය ආදිය නොසලකා සමානව සැලකීම ද ඇතුළත් වේ. **(ලකුණු 02)**

පුද්ගලයන්ගේ ජීවන ත්ත්වයේ ගුණාත්මක බවට බලපාන තවත් සමහර සාධක අතරට සේවා ස්ථානයේ කොන්දේසි, සෞඛ්‍ය සේවා, අධ්‍යාපනය සහ ද්‍රව්‍යාත්මක ජීවන තත්ත්වයන් ද ඇතුළත් කළ හැකි වේ.

**(ලකුණු 01)**

එබැවින් ඒක පුද්ගල දළ ජාතික ආදායමේ වර්ධනය ජීවන තත්ත්වය මිනුම් කිරීමේ දී නොමඟ යවන සුළු සහ ප්‍රමාණවත් නොවන මිනුමකි.



උසස් පෙළ විද්‍යා/ගණිත/කලා/වාණිජ හා තාක්ෂණ විෂය ධාරාවන්ට අදාල සියලුම ප්‍රශ්න පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබා ගැනීමට පිවිසෙන්න www.alevelapi.com වෙත .

**(iii)**

මානව සංවර්ධන දර්ශකය යනු දැනුම, ජීවන මට්ටම සහ සෞඛ්‍යය යන ප්‍රධාන පැතිකඩ 3ක් පදනම් කර ගනිමින් ගණනය කරනු ලබන සංයුක්ත දර්ශකයකි.

**(ලකුණු 01)**

**මානව සංවර්ධන දර්ශකයේ වාසි :**

1. රටවල් තුළ සහ රටවල් අතර ජීවන තත්ත්වයේ ගුණාත්මක බව මිනුම් කිරීමේ දී දළ දේශීය නිෂ්පාදිතයේ දත්ත මත පදනම් වන අනෙකුත් දර්ශක දුර්වල සහ ප්‍රමාණවත් නොවන මිනුම් වන අතර, එම දර්ශක සමඟ සලකා බැලීමේ දී ජීවන තත්ත්වය හොඳින් මිනුම් කිරීමට හැකි වීම මානව සංවර්ධන දර්ශකයේ වාසියකි.
2. ඒක පුද්ගල දේශීය ආදායම මගින් මානව සංවර්ධනයේ සමාජයීය පැතිකඩ මිනුම් නොවේ. මානව සංවර්ධන දර්ශකය යනු ආදායම් නිර්ණායක මත පමණක් පදනම් නොවන මානව සංවර්ධනයේ පැතිකඩ තුනක්, එනම් සෞඛ්‍ය සහ දීර්ඝායුෂ, අධ්‍යාපනය සහ ජීවත් වීම ආවරණය කරන්නා වූ සංයුක්ත දර්ශකයකි.
3. අනෙකුත් නිර්ණායකවලට වඩා මානව සංවර්ධන දර්ශකය ලෝකයේ රටවල් අතර සංවර්ධනය අන්තර්ජාතිකව සැසඳීමේ දී යොදාගත හැකි මිනුමකි.
4. අනෙකුත් නිර්ණායකවලට වඩා සමාජ ප්‍රතිපත්ති රටේ ආර්ථික සංවර්ධනයට කෙසේ බලපා ඇති ද යන්න විනිශ්චය කර ගත හැකි මිනුමකි.
5. මානව සංවර්ධන දර්ශකය ගණනයට අදාළ තොරතුරු වාර්ෂිකව යාවත්කාලීන කෙරේ. එමෙන්ම එම තොරතුරු සහ දත්ත පුද්ගලයින් සමූහයක් විසින් හැකි තරම් නිවැරදිව රැස් කරනු ලැබීම ද වාසියකි.

**(ඕනෑම වාසි දෙකක් සඳහා; ලකුණු 02)**

**මානව සංවර්ධන දර්ශකයේ අවාසි :**

1. මෙය සමාහාර මිනුමක් වන බැවින් රටවල් අභ්‍යන්තරයේ දැකිය හැකි සංවර්ධන විෂමතාවන් හඳුනාගත නොහැකි වීම.
2. මානව සංවර්ධනයේ සියලුම අංශ මේ යටතේ සැලකිල්ලට නොගැනීම.
3. දර්ශකය තුළ ඇති ප්‍රධාන පැතිකඩ තුනටම සමාන ලෙස බර තැබීම.
4. ගුණාත්මක වෙනස්කම් සැලකිල්ලට නොගැනීම. (උදා: පාසල් අධ්‍යාපනයේ ගුණාත්මක තත්ත්වය)
5. සංවර්ධනය කෙරෙහි බලපාන පාරිසරික පැතිකඩ මෙම දර්ශකය ගණනය සඳහා යොදා නොගැනීම.

**(ඕනෑම අවාසියකට ලකුණු 1 බැගින් ලකුණු 02)**

**(iv)**

දිනකට ඩොලර් 1.90 කට වඩා අඩු ආදායමක් ලබන පුද්ගලයෙකු අන්ත දරිද්‍රතා මට්ටමේ පුද්ගලයෙකු ලෙසට හඳුනා ගැනේ. 2009/10 වසර වන විට ශ්‍රී ලංකාවේ අන්ත දරිද්‍රතා මට්ටම සියයට 2.4 මට්ටමේ සිට 2012/13 වන විට සියයට 1.8 දක්වා අඩු විය.



උසස් පෙළ විද්‍යා/ගණිත/කලා/වාණිජ හා තාක්ෂණ විෂය ධාරාවන්ට අදාල සියලුම ප්‍රශ්න පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබා ගැනීමට පිවිසෙන්න www.alevelapi.com වෙත .

**අන්ත දරිද්‍රතාවයට බලපා ඇති සාධක:**

1. තරුණයින් සඳහා ආදායම් ඉපැයුම් මාර්ග සීමිත වීම.
2. දුර බැහැර ප්‍රදේශවල ජීවත් වීම.
3. සමාජ ආධාරක වැඩසටහන් අකාර්යක්ෂම වීම.
4. කෘෂිකර්මාන්තයේ අඩු ඵලදායීතාවය.
5. යටිතල පහසුකම් දුර්වල වීම.
6. ප්‍රධාන ආදායම් මාර්ගය කෘෂිකර්මයට සම්බන්ධ වූ කුටුම්භයක ජීවත් වීම
7. අධ්‍යාපන මට්ටමේ අඩු බව.
8. ශාරීරිකව දුර්වල වීම.
9. වියපත් වීම.
10. ඉඩම් සඳහා අයිතියක් නොමැති වීම.
11. මන්දපෝෂණය.
12. ගැටුම් නිසා අභ්‍යන්තරව අවතැන් වීම.

**(එක් හේතුවකට ලකුණු 1 බැගින්; උපරිම ලකුණු 05)**

**10.** (i) නිදහසින් පසු ශ්‍රී ලංකාවේ සංවර්ධන ප්‍රතිපත්ති දේශපාලන රෙජිමයන්ගේ වෙනස්වීම සමගම වෙනස් වී ඇති ආකාරය සැකෙවින් විස්තර කරන්න. (ලකුණු 05යි)

(ii) "අතිශයින්ම අත්‍යවශ්‍ය වූ ව්‍යුහාත්මක ප්‍රතිසංස්කරණ කල් දැමීම නිසා වර්තමානයේ ශ්‍රී ලංකා ආර්ථිකය ඉතා පහත් වෘද්ධි මාවතකට ඇද වැටී තිබේ." ශ්‍රී ලංකාව විසින් ක්‍රියාවට නැංවීම ප්‍රමාද කොට ඇති මෙම වෘද්ධි-ප්‍රවර්ධන ප්‍රතිසංස්කරණ කවරේ ද? (ලකුණු 05යි)

(iii) ශ්‍රී ලංකාවේ ආයෝජනය කෙරෙහි බාධක වශයෙන් පවත්නා ආයෝජන පරිසරයෙහි සහ සාධක වෙළෙඳපොළෙහි දුබලතා සඳහන් කරන්න. (ලකුණු 05යි)

(iv) "ශ්‍රී ලංකාවේ රාජ්‍ය ණය ප්‍රමාණය ඉතා ඉහළ අගයක පවතින අතර ම ණය කලඹෙහි ස්වභාවය ද ණයෙහි තිරසාරභාවය පිළිබඳ සැලකිය යුතු අවදානමක් පෙන්නුම් කරයි." විශේෂයෙන් ශ්‍රී ලංකාවේ රාජ්‍ය ණයෙහි ප්‍රමාණය සහ එහි සංයුතිය කෙරෙහි අවධානය යොමු කරමින් මෙම ප්‍රකාශය පැහැදිලි කරන්න. (ලකුණු 05යි)

**(i)**

නිදහසින් පසු ගත වූ දශක හතක කාලය තුළ, ශ්‍රී ලංකාව විවිධ සංවර්ධන ප්‍රතිපත්ති ගණනාවක් ක්‍රියාවට නඟා ඇති අතර, ඒවා දේශපාලන රෙජිමයන්ගේ වෙනස්වීම් සමග ම වෙනස් වී ඇත. පහතින් කෙටියෙන් දක්වා ඇත්තේ දේශපාලන රෙජිමයන්ගේ වෙනස් වීම මත සංවර්ධන ප්‍රතිපත්ති වෙනස් වූ අයුරු දක්වෙන අවධි කිහිපයකි.

**1. 1948-1956 : විවෘත ආර්ථිකය සමඟ ජනප්‍රියවාදී ආර්ථික ප්‍රතිපත්ති**

එක්සත් ජාතික පක්ෂය සමස්ත රටම ආවරණය වන පරිදි ජනප්‍රිය සමාජ සුභසාධන වැඩසටහන් ක්‍රියාවට නැංවීම. ආහාර සහනාධාර වැඩසටහන, රජයේ කාර්යභාරය පටු රාජ්‍ය නිර්බාධවාදය සහ යටත් විජිත රාජ්‍යය වෙතින් ව්‍යුත්පන්න වී තිබුණු රාජ්‍ය මැදිහත්වීම්වාදය යන දෙකෙහි සම්මිශ්‍රණයකින් සිදුවිම.



උසස් පෙළ විද්‍යා/ගණිත/කලා/වාණිජ හා තාක්ෂණ විෂය ධාරාවන්ට අදාල සියලුම ප්‍රශ්න පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබා ගැනීමට පිවිසෙන්න www.alevelapi.com වෙත .

**2. 1956-1965 : ආර්ථික පාලනයන් සමඟ ජනප්‍රියවාදී ආර්ථික ප්‍රතිපත්ති**

1956 දී දේශපාලන රෙජීමය වෙනස් වූ අතර, මහජන එක්සත් පෙරමුණ නමින් සභාග රජයක් පිහිටු විය. රාජ්‍ය ධනවාදය, රජයේ කාර්යභාරය පුළුල් වීම, මූලෝපායික කර්මාන්ත රජයේ ඒකාධිකාරය යටතේ පවත්වාගෙන යාම, මධ්‍යම හා කුඩා පරිමාණ කර්මාන්ත සඳහා රාජ්‍ය ආරක්ෂණය ලබා දීම, දේශීය කාර්මිකරණය සඳහා ආනයන ආදේශන ප්‍රතිපත්ති සහ 1959-68 සඳහා දස අවුරුදු සැලැස්මක් හඳුන්වා දීම.

**3. 1965-1970 : සීමිත ප්‍රමාණයක නිර්බාධ ආර්ථික ප්‍රතිපත්ති**

දේශපාලන රෙජීමය වෙනස් වූ අතර, එක්සත් ජාතික පක්ෂයේ මූලිකත්වයෙන් සභාග රජයක් පිහිටු විය. නිෂ්පාදනය සහ බෙදාහැරීම සඳහා මෙම රෙජීමය විසින් වෙළෙඳපොළ යන්ත්‍රණය යොදා ගැනීම, රාජ්‍ය ව්‍යවසායන් හඳුන්වාදීම සිදු නොකිරීම, රජයේ වියදම් යටිතල පහසුකම් සංවර්ධනයට කේන්ද්‍රගත කිරීම, සාම්ප්‍රදායික නොවන අපනයන ප්‍රවර්ධනය, ආනයන පාලන ලිහිල් කිරීම, සහ 1966-70 කෘෂිකාර්මික සංවර්ධන යෝජනා වැඩසටහනක් ක්‍රියාවට නැංවීම.

**4. 1970-1977 : දේශීය ආර්ථිකය ඉලක්ක කරගත් ආනයන ආදේශන කාර්මීකරණය**

- දේශපාලන රෙජීමය නැවතත් වෙනස් වූ අතර, ශ්‍රී ලංකා නිදහස් පක්ෂය ප්‍රමුඛ කරගත් රජයක් බිහි විය.
- ප්‍රතිසංස්කරණ හරහා ශ්‍රී ලංකාව සමාජවාදී රජයකට රැගෙන යාමට උත්සාහ කිරීම.
- අභ්‍යන්තරාභිමුඛ ආනයන ආදේශන ප්‍රතිපත්ති හඳුන්වා දීම.

**5. 1977-2005 : ආර්ථික නිර්බාධකරණය**

- 1977 දී එක්සත් ජාතික පක්ෂය බලයට පැමිණි අතර, දේශපාලන රෙජීමයේ වෙනස් වීම මත නැවතත් සංවර්ධන ප්‍රතිපත්ති වෙනස් විය. නැවතත් පෞද්ගලික අංශයේ වර්ධනයට සහ ආර්ථික නිදහස්කරණය දෙසට සංවර්ධන ප්‍රතිපත්ති යොමු විය.
- බාහිරාභිමුඛ කාර්මීකරණය සහ විවෘත ආර්ථික ප්‍රතිපත්ති හඳුන්වාදීම.
- එක්සත් ජනතා නිදහස් සංධානය 1995-2002 කාලය තුළ පාලනය කළ අතර, ආර්ථික ප්‍රතිපත්තියේ කැපී පෙනෙන වෙනසක් සිදු නොවුණි. විවෘත ආර්ථික ප්‍රතිපත්තිය පිළිගත් අතර, එයට මානුෂීය මුහුණුවරක් දීමට උත්සාහ කළේය. 2002-2004 නැවතත් එක්සත් ජාතික පක්ෂය විසින් රජයක් පිහිටු විය.

**6. 2005-2015 : ආරක්ෂණවාදය සමඟ ජාතික ආර්ථික ප්‍රතිපත්ති සහ පශ්චාත් සිවිල් යුධ යටිතල පහසුකම් සංවර්ධනය**

ශ්‍රී ලංකා නිදහස් පක්ෂය පෙරටු කරගත් එක්සත් ජනතා නිදහස් සංධානය 2005 දී නැවත බලය ලබා ගැනීමත් සමඟ දේශපාලන රෙජීමය වෙනස් විය. මෙම රජය නව-ලිබරල් ආර්ථික ප්‍රතිපත්ති ප්‍රතික්ෂේප කළ අතර, ජාතික ආර්ථික ප්‍රතිපත්ති, දේශීය කර්මාන්තය සහ ග්‍රාමීය යටිතල පහසුකම් සංවර්ධනයට ප්‍රමුඛත්වය දුණි. පෞද්ගලීකරණය සම්පූර්ණයෙන්ම ප්‍රතික්ෂේප කළ අතර, පශ්චාත් යුධ කාල පරිච්ඡේදය තුළ විශාල පරිමාණ යටිතල පහසුකම් ව්‍යාපෘති හඳුන්වා දුණි.



උසස් පෙළ විද්‍යා/ගණිත/කලා/වාණිජ හා තාක්ෂණ විෂය ධාරාවන්ට අදාල සියලුම ප්‍රශ්න පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබා ගැනීමට පිවිසෙන්න www.alevelapi.com වෙත .

**7. 2015 සිට : දැනුම කේන්ද්‍රීය සමාජ වෙළෙඳපොළ ආර්ථිකය**

2015 දී එක්සත් ජාතික පක්ෂයේ මූලිකත්වය ඇතිව නැවත දේශපාලන රෙජිමය වෙනස් විය. 2025 දැක්ම, 2017-2020 රජයේ ආයෝජන වැඩසටහන, 2018-2022 ජාතික අපනයන ප්‍රතිපත්තිය හඳුන්වා දීම.

තිරසාර සංවර්ධන ඉලක්ක සහ යහපාලන මූලධර්ම භාවිතයට ගැනීම. නිදහස් වෙළෙඳ ගිවිසුම්, ද්වීපාර්ශවීය වෙළෙඳ ගිවිසුම්, පුද්ගලික - රජයේ හවුල්කාරීත්වයන්, අපනයන මත පදනම් වූ ආර්ථික වර්ධනය, ඵලදායීතාවයේ සහ තාක්ෂණික වර්ධනය, මානව සංවර්ධනය, ආයෝජන දිරිගැන්වීම, සංචාරක ව්‍යාපාරය ප්‍රවර්ධනය කිරීම, දැනුම මත පදනම් වූ සමාජ වෙළෙඳපොළ ආර්ථික ප්‍රතිපත්ති රාමුවක් මත සේවා වියුක්ති ගැටළුවට සහ සංවර්ධනය කරා ප්‍රවේශ වීම.

**(ඕනෑම රෙජිම වෙනසක් සඳහා ලකුණු 01 බැගින් මුළු ලකුණු 05 ලබා දෙන්න. ඉහත රෙජිම වෙනස් වීම් කෙටියෙන් විස්තර කිරීම ප්‍රමාණවත්ය.)**

ඉහත පැහැදිලි කිරීම් අනුව, ශ්‍රී ලංකාවේ සංවර්ධන ප්‍රතිපත්ති කුමන දේශපාලන පක්ෂයක් බලය ලබා ගන්නේ ද මත පදනම්ව වෙනස් වී ඇති බව පෙනේ. නිදහසින් පසුව ශ්‍රී ලංකාවේ දේශපාලන පක්ෂ රෙජිම වෙනස් වීමකින් තොරව රටට එකඟ විය හැකි ජාතික ආර්ථික ප්‍රතිත්ති සකසා ගැනීම සඳහා එකඟ වීමට තවමත් අපොහොසත්ව ඇත.

**(ii)**

1. රාජ්‍ය පරිපාලනය ශක්තිමත් කිරීම. (රාජ්‍ය අංශයේ සංකීර්ණ ආයතනික රාමුව)
2. රජය සතු ව්‍යවසායන් හී ප්‍රතිසංස්කරණ.
3. සාධක වෙළෙඳපොළ ප්‍රතිසංස්කරණ (නිදසුනක් ලෙස ශ්‍රම වෙළෙඳපොළ ප්‍රතිසංස්කරණ, නම්‍යශීලී කාර්යාල වේලාවන්, වඩා අඩු දෘඪතාවක් සහිත සේවා කොන්දේසි)
4. නීතියේ ආධිපත්‍ය ස්ථාපිත කිරීම සඳහා වන ප්‍රතිසංස්කරණ.
5. අපනයන ප්‍රවර්ධන ක්ෂේත්‍රයේ ප්‍රතිසංස්කරණ (ඍජු විදේශීය ආයෝජන සඳහා එක් - නැවතුම් - ස්ථානයක් /One-Stop-Shop ඇති කිරීම ප්‍රමාද කිරීම, අයවැය හිඟය, ණය මට්ටම අඩු කර ගැනීම)

www.alevelapi.com

**(එක් ප්‍රතිසංස්කරණයකට ලකුණු 1 බැගින්; මුළු ලකුණු 05)**

**(iii)**

1. නියාමන අනුකූලතාවයට සම්බන්ධ ඉහළ ගණුදෙනු පිරිවැය සහ නියාමන ආයතන කෙරෙහි විශ්වාසයක් නොමැති වීම.
2. රතු පටි සහ දූෂණය (Red tape and Corruption)
3. දුර්වල තත්ත්වයේ යටිතල පහසුකම් (විශේෂයෙන් බලශක්ති සහ ප්‍රවාහනය, විදුලි පිරිවැය ඉහළ අතර විදුලි සැපයීමේ අවිනිශ්චිතතාවය)
4. මූල්‍යනය සඳහා ප්‍රවේශ වීම මිල අධික වීම සහ සීමා සහිත වීම.
5. නිපුණතා සහිත ශ්‍රම බලකා ගැටළුව, ශ්‍රම වෙළෙඳපොළේ පවත්නා දෘඪ, අනම්‍යශීලී සහ අත්තනෝමතික ස්වභාවය.
6. ආර්ථික සහ දේශපාලන අස්ථාවරත්වය.

**(ඕනෑම දුබලතාවක් සඳහා ලකුණු 1 බැගින්; මුළු ලකුණු 05)**



උසස් පෙළ විද්‍යා/ගණිත/කලා/වාණිජ හා තාක්ෂණ විෂය ධාරාවන්ට අදාල සියලුම ප්‍රශ්න පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබා ගැනීමට පිවිසෙන්න www.alevelapi.com වෙත .

**(iv)**

රාජ්‍ය ණය ආපසු ගෙවීමේ කොන්දේසි නැවත වෙනස් කිරීමේ සහ ප්‍රධාන රාජ්‍ය ගැළපීම් සිදු කිරීමේ කිසිදු අවශ්‍යතාවක් ඇති නොවන පරිදි රටකට තම වර්තමාන සහ අනාගත ණය සේවාකරණ වගකීම් සපුරාලීමට ඇති හැකියාව රාජ්‍ය ණය තිරසාරභාවය ලෙසට සැලකේ.

**(ලකුණු 01)**

**රාජ්‍ය ණයෙහි ඉහළ අගය,**

මධ්‍යම රජයේ ණය දළ දේශීය නිෂ්පාදිතයේ ප්‍රතිශතයක් ලෙසට 2017 පැවති 76.9% සිට 2018 වසර අවසානය වන විට 82.9% දක්වා ඉහළ ගොස් ඇත.

**හෝ,**

මධ්‍යම රජයේ සමස්ත නොපිය වූ ණය ප්‍රමාණය (නාමික වශයෙන් ගත් කළ) 2017 දී රුපියල් බිලියන 10,313 අගයක සිට 2018 දී රුපියල් බිලියන 11,977.5 දක්වා ඉහළ ගොස් ඇත. (නාමික අගය 16.1% කින් ඉහළ ගොස් ඇත.)

**(ඕනෑම ආකාරයකට රාජ්‍ය ණය ඉහළ යාම දැක්වීමට = ලකුණු 01)**

**ණය කළඹෙහි ස්වභාවය,**

සමස්ත නොපිය වූ රාජ්‍ය ණය තුළ දේශීය ණය දළ දේශීය නිෂ්පාදිතයේ ප්‍රතිශතයක් ලෙසට 2017 දී පැවති 41.7% සිට 2018 වන විට ආන්තිකව 41.6% දක්වා පහළ ගිය ද, විදේශීය ණය ගැනුම් 2017 දී දළ දේශීය නිෂ්පාදිතයේ ප්‍රතිශතයක් ලෙසට 35.2% මට්ටමේ සිට 2018 වන විට එම අගය 41.2% දක්වා ඉහළ ගියේය.

**හෝ,**

විදේශීය ව්‍යවහාර මුදලින් වටිනාකම තක්සේරු කළ දේශීය ණය ප්‍රමාණය 2017 වසර අවසානය වන විට පැවති රුපියල් බිලියන 702.1 (ඇමෙරිකානු ඩොලර් මිලියන 3911.0) සිට රුපියල් බිලියන 714.7 (ඇමෙරිකානු ඩොලර් මිලියන 4593.3) දක්වා ආන්තිකව ඉහළ ගොස් ඇත.

www.alevelapi.com

**හෝ,**

රජයේ සමස්ත නොපිය වූ විදේශ ණය ප්‍රමාණය 2017 දී රුපියල් බිලියන 4718.6 සිට 2018 වසර අවසානය වන විට රුපියල් බිලියන 5959.5 දක්වා සැලකිය යුතු ලෙස ඉහළ ගොස් ඇත.

**හෝ,**

2018 දී මධ්‍යම රජයේ නොපිය වූ විදේශීය ණය සංයුතිය තුළ සහණදායී නොවන විදේශීය ණය 55% ක් වූ අතර, සහණදායී විදේශීය ණය 45% ක් විය. සහණදායී ණය තුළ 37% කටම දායක වූයේ ජාත්‍යන්තර ස්වෛරීත්ව බැඳුම්කර වේ.



උසස් පෙළ විද්‍යා/ගණිත/කලා/වාණිජ හා තාක්ෂණ විෂය ධාරාවන්ට අදාල සියලුම ප්‍රශ්න පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබා ගැනීමට පිවිසෙන්න www.alevelapi.com වෙත .

**හෝ,**

2018 දීව්‍යවහාර මුදල් වර්ගය අනුව මධ්‍යම රජයේ සමස්ත නොපියවූ ණය සංයුතිය වන්නේ ශ්‍රී ලංකා රුපියල් (46%), එක්සත් ජනපද ඩොලර් (32%), වි.ගැ.හි. (8%), ජපන් යෙන් (5%) සහ යූරෝ (2%) වශයෙනි.

**(ඕනෑම ආකාරයකට ණය කළඹෙහි ස්වභාවය දැක්වීමට = ලකුණු 01)**

ශ්‍රී ලංකාවේ රාජ්‍ය ණයෙහි ප්‍රමාණය සහ ණය කළඹෙහි ස්වභාවය අනුව රාජ්‍ය ණය තිරසාර මට්ටමක පවත්වා ගෙන යාම වැදගත් වන අතර, එසේ සිදු කිරීමට අපොහොසත් වුවහොත් පහත සඳහන් අවදානම්වලට මුහුණ දීමට සිදු වේ.

- දැනටත් ඉහළ සහ වර්ධනය වන ණය මට්ටම ෆිස්කල් ප්‍රතිපත්තියේ සහ මූල්‍ය ප්‍රතිපත්තියේ සඵලතාවය අඩු කරයි. මෙවැනි රාජ්‍ය ණයෙහි වර්ධනයක් අයවැය හිඟය මත සහ ණය සේවාකරණ ගෙවීම් මත අවදානමක් ඇති කරයි.
- රටේ ඒක පුද්ගල ආදායමේ ඉහළ යාමට අනුව තව දුරටත් සහනදායී ණය ලබා ගැනීමේ අවකාශයක් නොමැති අතර, ඉහළ පොළී අනුපාතයන් යටතේ සහනදායී නොවෙන ණය සහ කෙටිකාලීන ණය ගැනුම් වලට යොමු වීමේ අවදානමක් ඇති කිරීම.
- විනිමය අනුපාතයේ ක්ෂය වීමත් සමඟ තවදුරටත් ණය කළඹ ඉහළ යාම.

**(ඕනෑම අවදානමකට ලකුණු 1 බැගින්; ලකුණු 02)**

www.alevelapi.com



උසස් පෙළ විද්‍යා/ගණිත/කලා/වාණිජ හා තාක්ෂණ විෂය ධාරාවන්ට අදාල සියලුම ප්‍රශ්න පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබා ගැනීමට පිවිසෙන්න www.alevelapi.com වෙත .

# සටහන්

www.alevelapi.com



උසස් පෙළ විද්‍යා/ගණිත/කලා/වාණිජ හා තාක්ෂණ විෂය ධාරාවන්ට අදාල සියලුම ප්‍රශ්න පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබා ගැනීමට පිවිසෙන්න www.alevelapi.com වෙත .